# (ළ) රැකීරක්ෂා හා කම්කරු සම්බන්ධතා

රැකීරක්ෂා.

කම්කරු දෙපාර්තමේන්තුව විසින්, ලංකා කම්කරු ගැසට් පත්‍රයේ පළකැරුන, රැකියා නැතියවුන් පිළිබඳ මාසික සංඛ්‍යාවලින් රැකියා හා වඩා හොඳ රැකියා සඳහා රැකීරක්ෂා කාර්යාලවල ලියා පදිංචි වූවන්ගේ මුළු ගණන දැක්වෙයි. දැනට, රැකීරක්ෂා කාර්යාල 24 ක්ද, ලියා පදිංචි කිරීමේ මධ්‍යස්ථාන 42 ක්ද වෙයි. මේ රැකීරක්ෂා කාර්යාල හා මධ්‍යස්ථාන බොහෝවක්ම නගරබද පිහිටුවා ඇති නිසා මුළු රටේ සංඛ්‍යා එකතු කිරීම සඳහා සැලසෙන සේවය ප්‍රමාණවත් නොවේ. මේ නිසාත්, අනෙකුත් ප්‍රකට කරුණු නිසාත්, ලියා පදිංචි වූවන්ගේ සංඛ්‍යාව රැකියා නොමැති අයගේ සංඛ්‍යාවට වඩා අඩුය. එසේම, එය රැකියා නොමැති අයගේ සංඛ්‍යාව දැක්වෙන හොඳ දර්ශකයක් නොවේ. 1960 දී ලියා පදිංචි වූවන්ගේ සංඛ්‍යාව 1,51,000 ක් විය. එහෙත් ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සහාය ඇතිව පවත්වන ලද නිදර්ශක සමීක්ෂණයකින් ලබාගත් ඇස්තමේන්තු අනුව රැකියා නොමැති අයගේ සංඛ්‍යාව 3, 40, 000 ක් විය. මේ අනුව සලකන විට එකී විෂමතාවයේ තරම දළ වශයෙන් සිතාගත හැකිය. එසේ වුවද, ලියා පදිංචි වූවන්ගේ සංඛ්‍යාව අසාමාන්‍ය ලෙස වැඩිවීම, නිවැරදිව පැහැදිලි කළ හැකි වුවහොත්, කාල ඡේදයක රැකියා නොමැති වුනගේ අඩු වැඩිවීම හැදෑරීම සඳහා ලියා පදිංචි වූවන්ගේ සංඛ්‍යාව උපයෝගී කර නොගත හැක්කේ නොවේ.

1965 හේ මුල් මාස හතර, තුළ රැකියා සඳහා ලියා පදිංචි වූවන්ගේ සංඛ්‍යාව නොවෙනස්වම වාගේ පැවතිණි. එහෙත් ඉතිරි මාසවලදී මේ සංඛ්‍යාව නොවෙනස්වම ශීඝ්‍රයෙන් වැඩිවිය. වසරේ මුල් කාලය තුළ වැඩි වෙනසෙක් ඇති නොවීමට හේතුව, මහජනයා මහා මැතිවරණ කටයුතුවල උද්‍යොගිමත්ව නියැලී සිටීම විය හැකිය. ඉන්පසුව ඇතිවූ ශීඝ්‍ර වැඩිවීම සඳහා තුඩුදුන් කරුණු එතරම් පැහැදිලි නැත. සමහරවිට රජය වෙනස්වීම නිසා බලාපොරොත්තු වැඩිවීම විය හැකිය. 1948 හා 1956 වර්ෂ වලදීද මැතිවරණයෙන් පසු ලියා පදිංචි වූවන්ගේ සංඛ්‍යාව මෙසේ බොහෝ සෙයින් වැඩිවී ඇත.

ලියා පදිංචි වූවන්ගේ සංඛ්‍යාව 1965 දී සියයට 20 කින් වැඩිවී ඇත. 1964 දී වැඩිවූයේ සියයට 7 කිනි. විශාලම වැඩිවීම සටහන් වී ඇත්තේ "කාර්මික හා ලිපිකරු" ගණයෙහිය. මේ ගණයට ඖෂධ සංයෝජකයන්, ෆෝර්මන් වරුන්, ඡායාරූප ශිල්පීන්, ලිපිකරුවන්, ආදීන් ඇතුලත් වන අතර මෙය සියයට 34 කින් වැඩිවිය. පුහුණු, අර්ධ පුහුණු හා නොපුහුණු ශ්‍රෙණිවල ලියා පදිංචි වූවන්ගේ සංඛ්‍යාවෙහි වැඩිවීම් පිළිවෙලින් සියයට 12, 27, හා 10 විය. මෙකී ශතකයන් 1964 වර්ෂයේ අනුරූප සංඛ්‍යා වන 6, 3 සහ 8 සමග සැසඳිය හැකිය.

මෑත වර්ෂවලදී රැකීරක්ෂා කාර්යාල විසින් රැකියා ලබාදෙනු ලැබූ අයගේ සංඛ්‍යාව II (ළ) - 1 සටහනේ දක්වා ඇත.

### සංඛ්‍යා සටහන II (උ෩) - 1

### රැකියා ලබාදුන් සංඛ්‍යා හා ඒ ඒ වශීයෙන් ලියා පදිංචි වී ඇති සංඛ්‍යාවට එහි ඇති සියයට ගණන.

| වර්ෂය | කාර්මික හා ලිපිකරු | % | පුහුණු | % | අර්ධ පුහුණු | % | නුපුහුණු | % | එකතුව | % |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1956 | 1,913 | 11·9 | 845 | 8·6 | 1,565 | 6·1 | 4,162 | 12·1 | 8,485 | 9·9 |
| 1957 | 1,176 | 6·3 | 709 | 5·3 | 1,180 | 3·8 | 3,053 | 6·4 | 6,118 | 5·5 |
| 1958 | 1,827 | 9·2 | 800 | 5·9 | 1,006 | 3·1 | 2,251 | 4·4 | 5,884 | 5·0 |
| 1959 | 1,667 | 8·0 | 1,045 | 7·5 | 1,275 | 3·8 | 3,218 | 5·4 | 7,205 | 5·6 |
| 1960 | 1,400 | 5·3 | 771 | 4·6 | 1,247 | 3·6 | 4,744 | 6·5 | 8,162 | 5·4 |
| 1961 | 1,259 | 4·6 | 631 | 3·5 | 964 | 2·8 | 2,794 | 3·9 | 5,648 | 3·7 |
| 1962 | 1,263 | 3·7 | 468 | 2·7 | 809 | 2·3 | 2,315 | 3·5 | 4,857 | 3·2 |
| 1963 | 1,322 | 3·7 | 502 | 3·0 | 836 | 2·3 | 2,466 | 3·9 | 5,129 | 3·4 |
| 1964 | 1,722 | 4·4 | 535 | 3·1 | 945 | 2·5 | 3,599 | 5·5 | 6,801 | 4·3 |
| * 1965 | 1,498 | 3·1 | 846 | 4·5 | 1,039 | 2·4 | 3,730 | 5·3 | 7,113 | 3·9 |

* තාවකාලිකයි

සංඛ්‍යා: කම්කරු දෙපාර්තමේන්තුවෙනි.

1965 තුළදී, රැකීරක්‍ෂා කාර්යාල මගින් රැකියා සපයනු ලැබූවන්ගේ සංඛ්‍යාවෙහි සුළු වැඩිවීමක් ඇතිවුවද, ලියා පදිංචි වී ඇති මුළු සංඛ්‍යාවට ඇති සමානුපාතය 1964 වර්ෂයේ සමානුරූප සංඛ්‍යාවට වඩා අඩුය.

**පෞද්ගලික අංශයේ රැකීරක්‍ෂා.**

1965 දී රාජ්‍ය අංශයේ රැකියා සංඛ්‍යාවෙහි අඩු වැඩි වීම පිළිබඳ කැරුන පරීක්‍ෂණයකදී, රජයේ දෙපාර්තමේන්තු වලින් සියයට 51 කින්ද, අර්ධ රාජ්‍ය ආයතන වලින් සියයට 82 කින්ද, සංඛ්‍යා තොරතුරු ලබාගැනීමට මහ බැංකුවට හැකිවිය. දෙවැනිව කී ගණයට, රජයේ සමාගතන, ලංකා බැංකුව, මහජන බැංකුව, විශ්ව විද්‍යාල සහ මහ බැංකුව වැනි ආයතන ඇතුළත් විය

බැංකුවේ විමසීමට පිළිතුරු සැපයූ දෙපාර්තමේන්තු 41 හි 1965 අවසානයේදී සිටි මුළු සේවක සංඛ්‍යාව 1,58,822 ක් විය. මේ සේවකයන්ගෙන් සියයට 98·1 ක් ස්ථිර සේවාවේ වූ අතර, සියයට 0·7 ක් තාවකාලික වශයෙන්ද, සියයට 1·1 ක් අනියම් වශයෙන්ද සේවාවේ නිරත වී සිටියහ. වර්ෂය ආරම්භයේ හා අවසානයේ රැකියාවල නියුතුවූවනගේ සංඛ්‍යාවල වෙනෙස, රැකීරක්‍ෂා වෙනස්වීම මැණීම සඳහා උපයෝගී කොට ගත් කල, 1965 වර්ෂය තුළදී රජයේ දෙපාර්තමේන්තුවල ස්ථිර හා තාවකාලික රැකියා සියයට 2·8 කින් වැඩිවී ඇතැයි ඇස්තමේන්තු කර ඇත. අනියම් සේවකයන් පිළිබඳ සංඛ්‍යාවෙහි දැඩි උච්චාවචනයක් ඇති නිසා අනියම් රැකියාවල ඇතිවූ වෙනස්කම් මේ ඇස්තමේන්තුවට ඇතුළත් කොට නැත.

බැංකුවට සංඛ්‍යා තොරතුරු ලබාගත හැකිවූ අර්ධ රාජ්‍ය ආයතන 37 හි, 1965 අවසානයට සේවාවේ නියුතුව සිටි මුළු සංඛ්‍යාව 76,884 ක් විය. මෙයින් සියයට 11 ක් පමණ අනියම් සේවකයෝ වූහ. ස්ථිර සේවක සංඛ්‍යාව සියයට 87 ක්වූ අතර, තාවකාලික සේවක සංඛ්‍යාව සියයට 2 ක් විය. වාර්තා කර ඇති පරිදි, අර්ධ රාජ්‍ය ආයතනවල ස්ථිර හා තාවකාලික රැකියා වර්ෂය තුළ සියයට 10 කින් වැඩිවූ අතර, රජයේ දෙපාර්තමේන්තුවල රැකියා වැඩිවීම සියයට 2·8 ක් විය.

**කම්කරු සම්බන්ධතා.**

1965 තාවකාලික සංඛ්‍යා 1964 සංඛ්‍යා සමග සසඳන කල, 1965 වැඩ වර්ජන සංඛ්‍යාව හා ඉන් නැතිවූ මිනිස් දවස් ගණන සැලකිය යුතු සේ අඩුවී ඇත. වැවිලි නොවන අංශයේ 1965 දී නැතිවූ මිනිස් දවස් සංඛ්‍යාව 77,000 ක් පමණ විය. මෙය

ඉකුත් දශකයේදී නැතිවූ සාමාන්‍ය මිනිස් දවස් ගණනට වඩා බොහෝ සෙයින් අඩුය. වැවිලි නොවන අංශය ඉකුත් වසරට වඩා සැලකිය යුතු දියුණුවක් ලබා ඇත ද, වැවිලි අංශය සම්බන්ධයෙන් මෙසේ සඳහන් කල නොහැකිය. ඇත්ත වශයෙන්, වැවිලි අංශයෙහි නැති වූ මිනිස් දවස් ගණන ඉකුත් දශකයේ සාමාන්‍යයට වඩා බොහෝ සෙයින් වැඩිය. වැඩ වර්ජන සංඛ්‍යාව ද ඊට සම්බන්ධ වූ සේවකයන්ගේ සංඛ්‍යාව හා වැඩ වර්ජන නිසා නැති වූ මිනිස් දවස් ගණන II (ඌ) - 2 සටහනෙහි දක්වා ඇත.

සංඛ්‍යා සටහන II (ඌ) 2

## වැඩ වර්ජන

| වර්ෂය | වැවිලි | | | වෙනත් රැකියාවන් | | |
|---|---|---|---|---|---|---|
| | වැඩ වර්ජන ගණන | සම්බන්ධ වූ කම්කරුවන් | නැතිවූ මිනිස් දවස් | වැඩ වර්ජන ගණන | සම්බන්ධ වූ කම්කරුවන් | නැති වූ මිනිස් දවස් |
| 1955 | 160 | 1,143 | 69,913 | 47 | 11,293 | 36,016 |
| 1956 | 99 | 56,908 | 2,00,888 | 115 | 31,852 | 1,52,966 |
| 1957 | 177 | 2,97,061 | 6,18,050 | 127 | 70,239 | 1,90,443 |
| 1958 | 123 | 39,372 | 3,40,632 | 96 | 42,713 | 3,99,228 |
| 1959 | 177 | 47,318 | 3,52,095 | 71 | 42,453 | 4,60,141 |
| 1960 | 123 | 42,528 | 2,59,948 | 37 | 4,839 | 15,139½ |
| 1961 | 90 | 29,223 | 3,17,866 | 39 | 38,013 | 1,70,372 |
| 1962 | 138 | 42,569 | 1,93,792 | 50 | 25,730 | 8,01,882 |
| 1963 | 174 | 62,511 | 3,59,905 | 58 | 29,819 | 4,79,678 |
| 1964 | 201 | 68,009 | 6,11,060 | 103 | 21,400 | 2,74,623 |
| 1965 | 157 | 64,306 | 4,54,359 | 43 | 7,196 | 77,465 |

* තාවකාලිකයි.

සංඛ්‍යා—දෙපාර්තමේන්තුවෙනි.

1965 තුළ ඇති වූ වැඩ වර්ජන සංඛ්‍යාව 1964 සංඛ්‍යාවට වඩා සියයට 34 කින් අඩු වුවද, වැඩ වර්ජන සඳහාවූ ප්‍රධාන හේතූන් අතර, සාපේක්ෂික වැදගත්කම එලෙසින් ම පැවතුනි. 1964 රේ මෙන් ම වැඩ වර්ජන වලින් සියයට 30 කට හේතු වූයේ රැකියා අහිමි වීමය. සියයට 29 ක් වතුවල නීති, වැඩ පිළියෙල කිරීම ආදිය නිසාද, සියයට 10 ක්ම ගෙවීම් ප්‍රමාද කිරීම නිසාද ඇතිවිය. සියයට 10 කට හේතු වූයේ පොදු ඉල්ලීම්ය. පඩි වැඩි කරන ලෙස ඉල්වා කැරුන වර්ජන සංඛ්‍යාව මුළු වර්ජන සංඛ්‍යාවෙන් සියයට 3 ක් පමණ විය.